## WEATHER FORECAST FOR 02nd May 2019
## (Issued at 1200 noon on 01st May 2019)

**The Extremely Severe Cyclonic Storm 'FANI' (pronounced as FONI) over West-central and Southwest Bay of Bengal to the Northeast of Sri Lanka, was located near latitude 13.9N, Longitude 84.0E at 05.30 a.m. of 01st May 2019, about 670 km northeast of Trincomalee. It is likely to move north-northeastwards while moving away from the island towards the Odisha coast of India.**

**Cloudy skies, Strong winds and showery conditions are expected to continue over the island and surrounding sea areas.**

Strong winds up to 60 kmph can be expected over the island, particularly in Central hilly areas, Northern, North central, Uva and Southern provinces and in Puttalam, Trincomalee and Batticaloa districts.

Showers or thundershowers will occur at times over Sabaragamuwa, Central, Southern, Western, Uva and North-western provinces. Heavy falls about 100 mm can be expected at some places in the above provinces. Showers or thundershowers will occur at several places elsewhere.

**General public, Naval and fishing communities are requested to be attentive about future advisories issued by the Department of Meteorology in this regards.**

මධ්‍ය-බටහිර සහ නිරිත දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ, ශ්‍රී ලංකාවට ඊසාන දෙසින් පවතින අතිශයින් චණ්ඩ සුළි කුණාටුව ('ෆොනී') මැයි 01 වන දින උදෑසන 05.30 වන විට ත්‍රිකුණාමලය සිට ඊසාන දෙසින් කි.මී. 670 පමණ දුරින් උතුරු අක්ෂාංශ 13.9 ත් නැගෙනහිර දේශාංශ 84.0 ත් ආසන්නව ස්ථානගතව පවතී. මෙම පද්ධතිය දිවයිනෙන් ඉවතට ගමන් කරමින් උතුරට බරව ඊසාන දෙසට ගමන් කර ඉන්දියාවේ ඔඩිස්සා වෙරළ දෙසට ගමන් කරනු ඇතැයි අනුමාන කෙරේ.

දිවයිනේ සහ දිවයින වටා මුහුදු ප්‍රදේශවල අහස වලාකුළින් බරව පවතිනු ඇති අතර තද සුළං සහ තද වැසි තත්ත්වයක් තවදුරටත් පවතිනු ඇතැයි බලාපොරොත්තු වේ.

දිවයින හරහා විශේෂයෙන් මධ්‍යම කඳුකර ප්‍රදේශ වලත් උතුරු, උතුරුමැද, ඌව සහ දකුණු පළාත්වලත් පුත්තලම, ත්‍රිකුණාමලය සහ මඩකළපුව දිස්ත්‍රික්ක වලත් විටින් විට හමන පැ.කි.මී. 60 දක්වා තද සුළං බලාපොරොත්තුවේ.

දිවයිනේ සබරගමුව, මධ්‍යම, දකුණු, බස්නාහිර, ඌව සහ වයඹ පළාත්වල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. මෙම පළාත්වල ඇතැම් ස්ථාන වලට මි.මී.100 පමණ තද වර්ෂාපතනයන් ඇති විය හැක.
සෙසු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිලිබඳ අවධානය යොමුකරන ලෙස මහජනතාවගෙන් සහ ධීවර හා නාවුක ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

## WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS (Issued at 1200 noon on 01st May 2019)

**The Extremely Severe Cyclonic Storm 'FANI' (pronounced as FONI) over West-central and Southwest Bay of Bengal to the Northeast of Sri Lanka, was located near latitude 13.9N, Longitude 84.0E at 05.30 a.m. of 01st May 2019, about 670 km northeast of Trincomalee. It is likely to move northwestwards till 01st May noon and thereafter recurve north-northeastwards towards Odisha Coast, India while moving away from the island.**

Showers or thundershowers will occur at times in sea areas around the island and heavy showers are likely at some places.

Winds will be South-westerly and speed will be 35-45 kmph and it can increase up to 60 kmph at times over the sea areas around the island

Wind speed will be 70-80 kmph over the deep sea areas from Mannar to Hambantota via Kankasanturai and Batticaloa. Seas can be very rough to high at times in the sea area from Mannar to Trincomalee via Kankasanturai as the wind speed can increase up to 100 kmph at times.

Wind speed can increase up to 150-160 kmph, gusting up to 200 kmph in the sea areas within 300km from the center of the above system.

**The fishermen are advised not to venture into sea areas to the North, East, Northeast, Southeast and Northwest of Sri Lanka, until further notice.**

**Naval and fishing communities are requested to be attentive about future advisories issued by the Department of Meteorology in this regard.**

**<u>ඉදිරි පැය 24 සඳහා දිවයින වටා ඇති මුහුදේ කාලගුණ තත්ත්වය</u>**

**<u>2019 මැයි මස 01 දින මධ්‍යහන 1200 ට නිකුත් කරන ලදි.</u>**

මධ්‍ය-බටහිර සහ නිරිත දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ, ශ්‍රී ලංකාවට ඊසාන දෙසින් පවතින අතිශයින් චණ්ඩ සුළි කුණාටුව ('ෆොනි') මැයි 01 වන දින උදෑසන 05.30 වන විට ත්‍රිකුණාමලය සිට ඊසාන දෙසින් කි.මී. 670 පමණ දුරින් උතුරු අක්ෂාංශ 13.9 ත් නැගෙනහිර දේශාංශ 84.0 ත් ආසන්නව ස්ථානගතව පවතී. මෙම පද්ධතිය දිවයිනෙන් ඉවතට ගමන් කරමින් වයඹ දෙසට ගමන් කර මැයි මස 01 දින දහවලට පසු උතුරට බරව ඊසාන දෙසට ගමන් කර ඉන්දියාවේ ඔඩිස්සා වෙරළ දෙසට ගමන් කරනු ඇතැයි අනුමාන කෙරේ.

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වන අතර ඇතැම් මුහුදු ප්‍රදේශ වල තද වැසි ඇති විය හැක.

දිවයින වටා මුහුදු ප්‍රදේශවල සුළං නිරිත දෙසින් හමන අතර සුළගේ වේගය පැ.කි.මී. 35-45 පමණ වේ. සුළගේ වේගය විටින් විට පැ.කි.මී 60 දක්වා වැඩි විය හැක.

මන්නාරම සිට කන්කසන්තුරය සහ මඩකළපුව හරහා හම්බන්තොට දක්වා වන ගැඹුරු මුහුදු ප්‍රදේශවල විටින් විට හමන පැ.කි.මී 70-80 දක්වා වන සුළං බලාපොරොත්තුවේ. මන්නාරම සිට කන්කසන්තුරය හරහා ත්‍රිකුණාමලය දක්වා වන ගැඹුරු මුහුදු ප්‍රදේශවල විටින් විට හමන පැ.කි.මී 100 දක්වා වන ප්‍රහාරාත්මක සුළං සමඟ මුහුදු ප්‍රදේශ ඉතා රළු සිට දළ රළු වේ.
සුළි කුණාටු පද්ධතියේ කේන්ද්‍රයේ සිට කි.මී. 300 දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය පැ.කි.මී 150-160 දක්වා වන අතර විටින් විට පැ.කි.මී 200 දක්වා වැඩි විය හැක.

ශ්‍රී ලංකාවට උතුරු, නැගෙනහිර, ඊසාන, ගිනිකොණ සහ වයඹ දෙසින් වන මුහුදු ප්‍රදේශවල නැවත දැනුම්දෙන තුරු ධීවර කටයුතු වලින් වලකින ලෙස උපදෙස් දෙනු ලැබේ.

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිලිබඳ අවධානය යොමුකරන ලෙස ධීවර හා නාවුක ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

කාලගුණ විද්‍යාඥ (Duty Meteorologist),
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (Department of Meteorology)

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date : 2019/05/01
Time : 1229 hs
D (Ops)/DG/ADO
DISASTER MANAGEMENT CENTRE